සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

**11 - ශ්‍රේණිය** 59379

**බුද්ධ ධර්මය - I**

නම/විභාග අංකය :- ........................................................................ **කාලය පැය 1 යි.**

**(i) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.**
**(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
**(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

1. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේ හමුවීමට තමාම යාමට සුදුසු කරුණු වශයෙන් දක්වූ කරුණුවලට අයත් නොවන කරුණ වන්නේ,
   i. පරිවාර සම්පත් හැරදමා පැවිදිවීම. ii. ශ්‍රේෂ්ඨ ආචාර්යවරයෙකු වීම.
   iii. ශාක්‍ය වංශිකයෙකු වීම. iv. රූමත් බව.

2. ධම්ම පදයේ එන "උට්ඨානවතෝ - සතිමතෝ" යන ගාථාවේ සඳහන් පරිදි පුද්ගලයෙකු තුළ තිබිය යුතු සුවිශේෂ ලක්ෂණ 7ට ඇතුළත් නොවන කරුණ වන්නේ,
   i. උත්සාහවන්ත බව ii. සංවරශීලී බව
   iii. විමර්ශනශීලී බව iv. ආචාරශීලී බව.

3. "පස්පව්කොට මෙතනත් ලැබ ශෝකය - ගොස් නිරයේ දුක් විඳිති අනේකය" මෙම කවි දෙපදය උපුටාගෙන ඇති උපදේශ කාව්‍ය වන්නේ,
   i. ලෝකෝපකාරය ii. ලෝවැඩ සඟරාව
   iii. සුභාෂිතය iv. සිරිත් මල්දම.

4. "අපමණ කලක් තුළ එකවරකදී පිපෙන - මුළු ලොව අසිරිමත් කුසුමය බුදුරුවන" බුදුරජාණන් වහන්සේ ගැන මෙම කවි දෙපදයේ එන අදහසට සමාන අදහසක් දක්වූ මෑත කාලයේ විසූ වියතාණන් වන්නේ,
   i. ශ්‍රීමත් එඩ්වින් අර්නෝල්ඩ් මහතා ii. එච්. ජී. වේල්ස් මහතා
   iii. මහාචාර්ය සෝන්ඩර්ස් මහතා iv. ජවහර්ලාල් නේරුතුමා

5. ථෙරවාදී ධර්ම සංගායනා ත්‍රිත්වය පැවැත්වූ නගර අනුපිළිවෙළින් සඳහන් පිළිතුර වනුයේ,
   i. රජගහ නුවර, සැවැත් නුවර, පාටලීපුත්ත නුවර
   ii. රජගහ නුවර, විශාලා මහනුවර, පාටලීපුත්ත නුවර
   iii. සැවැත් නුවර, කොසඹෑ නුවර, විශාලා මහනුවර
   iv. විශාලා මහනුවර, රජගහ නුවර, පාටලීපුත්ත නුවර

6. ධර්මයට හා සදාචාර සංවර්ධනයට මුල්තැන දී කටයුතු කිරීම ධාර්මික රාජ්‍ය පාලකයෙකුගේ ප්‍රතිපත්තියයි. ඒ අනුව තම රාජ්‍ය පාලන මූලධර්ම සකසා ගත් නරපතියෙක් මහජනතාව තමන්ගේ දරුවන් ලෙස සැලකුවේය. එම රජතුමා නම්,
   i. දුටුගැමුණු රජතුමා ය. ii. දෙවන පැතිස් රජතුමා ය.
   iii. අජාසත් රජතුමා ය. iv. ධර්මාශෝක රජතුමා ය.

7. ගිහියෙකුට අත් විඳිය හැකි සැප 4ක් බුදු දහමේ ඉගැන්වේ. ඒ අනුව ධනය තිබීමෙන් යමෙකුට ඇතිවන සැපය හඳුන්වනු ලබන්නේ,
   i. භෝග සුඛය ii. අත්ථි සුඛය
   iii. අනවජ්ජ සුඛය iv. අනණ සුඛය

8. බුදුදහම ගැන අපේ දැනුම පුළුල් කරගැනීමට අතිරේක දහම් පොතපත කියවීම අත්‍යවශ්‍යය. ඒ අනුව අපට කියවීමට සුදුසු පොතක් වූ "බුදුන් වදාළ ධර්මය" නැමැති ග්‍රන්ථය රචනා කළේ,
   i. පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි ii. පූජ්‍ය ගණේගම සරණංකර හිමි
   iii. පූජ්‍ය වල්පොල රාහුල හිමි iv. පූජ්‍ය වැලිවිට සරණංකර හිමි

9. බුදු පිළිම නිර්මාණයේදී යොදාගන්නා මුද්‍රා සංඛ්‍යාත්මක වශයෙන් ගතහොත්,
   i. හතරයි    ii. හයයි    iii. පහයි    iv. තුනයි

10. අමාවතුර, ශ්‍රී ලංකාවේ සිංහල භාෂාවෙන් රචිත ශ්‍රේෂ්ඨතම හා පැරණිතම ගද්‍ය කාව්‍ය ලෙස සැලකෙන කෘතියකි. මෙම ග්‍රන්ථය රචනා කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ බුදුගුණයක් විස්තර කරමිනි. එම බුදුගුණය නම්,
   i. අරහං ගුණය    ii. සුගත ගුණය
   iii. පුරිසදම්ම සාරථී ගුණය    iv. ලෝකවිදූ ගුණය

11. සමාජ සබඳතාවයන්හි ධාර්මික පිළිවෙත උගන්වනු ලබන සිඟාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයෙහි උතුරු දිශාවට දක්වා ඇත්තේ,
   i. මව්පියන් ය.    ii. ගුරුවරු ය.    iii. මිතුරන් ය.    iv. පැවිදි අය.

12. පංච උපාදානස්කන්ධය විශේෂකොට දක්වමින් භාවනා කිරීම විපස්සනා භාවනාව ලෙස හැඳින්වේ. මෙම භාවනාව හැඳින්වීමට වඩාත් සුදුසු නම් ඇතුළත් පිළිතුර වනුයේ,
   i. ත්‍රිලක්ෂණ හා ප්‍රඥා භාවනාව    ii. සමාධි හා විදර්ශනා භාවනාව
   iii. අනිත්‍ය හා සමථ භාවනාව    iv. චිත්ත හා සමාධි භාවනාව

13. ධාර්මික රාජ්‍ය පාලකයකු විසින් අනුගමනය කළ යුතු රාජ්‍ය පාලන මූලධර්මවලට අදාළ නොවන කරුණ සඳහන් පිළිතුර වනුයේ,
   i. දසරාජ ධර්ම    ii. සතර සංග්‍රහ වස්තු
   iii. දස සක්විති වත්    iv. සතර මහෝපදේශ

14. සමාජයේ සෙසු පුද්ගලයින් ප්‍රාණඝාතය වැනි අකුසල ධර්මයන්ගෙන් අපිරිසිදුව සිටියද තමා ඒවායෙන් වැළකී සිටින්නේමැයි අදිටන් කරගෙන පිරිසිදු සිතින් වාසය කිරීම බුදු දහමේ හඳුන්වන නම වනුයේ,
   i. පඤ්චසීල ප්‍රතිපදාව    ii. සල්ලේඛ ප්‍රතිපදාව
   iii. සේඛ ප්‍රතිපදාව    iv. මධ්‍යම ප්‍රතිපදාව

15. ථෙරවාදී ත්‍රිපිටක ධර්මය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට එය මුද්‍රණය කිරීම අරමුණු කොට පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXI SOCIETY ) ආරම්භ කළේ,
   i. රිස් ඩේවිඩ්ස් මහතා    ii. විල්හෙල්ම් ගෛගර් මහතා
   iii. H. G. වේල්ස් මහතා    iv. ගුණපාල මලලසේකර මහතා

16.. "යාදිසං වපතේ බීජං - තාදිසං හරතෙ ඵලං" වපුරන බීජවලට අනුරූපව අස්වැන්න ලැබේ. මෙම ගාථා පාඨය ඇසුරින් අප ජීවිත සකස්කර ගැනීමට ලැබෙන උපදේශනය වන්නේ,
   i. කෘෂිකාර්මික ජීවන ක්‍රමය අපට වඩාත් උචිත බව.
   ii. රෝපණ ශක්තිය ඇති බීජවලින් වැඩි අස්වැන්නක් ලැබෙන බව.
   iii. කරනු ලබන කර්මවල ස්වරූපය අනුව විපාක ලැබෙන බව.
   iv. ලැබෙන අත්දැකීම් මත ජීවිත හැඩගසා ගත යුතු බව.

17. ථෙරවාදී තෙවන ධර්ම සංගායනාව තුළින් දේශ දේශාන්තරයන්හි බුදුදහම ව්‍යාප්ත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වනවාසී දේශයට ධර්මය ගෙන ගිය රහතන්වහන්සේ වන්නේ,
   i. මහා රක්ඛිත හිමි ය.    ii. මහාදේව හිමි ය.
   iii. රක්ඛිත හිමි ය.    iv. ධම්මරක්ඛිත හිමි ය.

18. බුදුරජාණන් වහන්සේ පාරමිතා පිරූ ආකාරය ජාතක කථා තුළින් නිරූපණය වේ. ඒ අනුව උන්වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන ජාතක කථාවක් වන්නේ,
   i. වණ්ණුපථ ජාතකය    ii. මඛාදේව ජාතකය
   iii. උම්මග්ග ජාතකය    iv. තේමිය ජාතකය

19. විශාල ධනයක් රැස්කරගත් පහත් කුලවන්තයෙකුට වුවද අනෙක් කුල තුනම තමා යටතට ගත හැකි බව මධුර රජුට දහම් දෙසමින් පැවසූ රහතන් වහන්සේ වන්නේ,
   i. සැරියුත් හිමි ය.    ii. මහා කාශ්‍යප හිමි ය.
   iii. මහා කච්චායන හිමි ය.    iv. අනුරුද්ධ හිමි ය.

20. පුනර්භවය ගැන පර්යේෂණ කොට පොත් ගණනාවක් ලියා ඇති බටහිර විද්වතා වන්නේ,
    i. මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් මැතිතුමා. ii. මහාචාර්ය සොන්ඩර්ස් මැතිතුමා.
    iii. එඩ්වින් අර්නෝල්ඩ් මැතිතුමා. iv. රිස් ඩේවිඩ්ස් මැතිතුමා.

21. ජාතක කතා ඇසුරින් ගද්‍ය හා පද්‍ය කෘති රචනා කිරීම පැරණි සාහිත්‍ය යුගවල දැකිය හැකි ලක්ෂණයකි. ඒ අනුව කව්සිළුමිණ හා කාව්‍යශේඛරය රචනා කිරීම සඳහා පදනම් කරගත් ජාතක කතා පිළිවෙළින් සඳහන් පිළිතුර වනුයේ,
    i. ගුත්තිල ජාතකය හා උම්මග්ග ජාතකය
    ii. සස ජාතකය හා මඛාදේව ජාතකය
    iii. කුස ජාතකය හා සත්තුභත්ත ජාතකය
    iv. සඳකිඳුරු ජාතකය හා වෙස්සන්තර ජාතකය

22. රාජ්‍ය පාලන මූලධර්ම පිළිබඳ උපදෙස් ඇතුළත් බෞද්ධ සූත්‍ර දේශනාවක් ලෙස සැලකිය හැක්කේ,
    i. සිඟාලෝවාද සූත්‍රය ii. අග්ගඤ්ඤ සූත්‍රය
    iii. චක්කවත්තිසීහනාද සූත්‍රය iv. වාසෙට්ඨ සූත්‍රය

23. පොළොන්නරු යුගයට අයත් ඉපැරණිම බෞද්ධ චිත්‍ර ඇතැයි සලකනු ලබන ස්ථානය වන්නේ,
    i. තිවංක පිළිමගෙය ii. පිදුරංගල iii. හිඳගල iv. සීගිරිය

24. බෞද්ධ කලා නිර්මාණ අතරින් සඳකඩ පහණට ලැබෙන්නේ වැදගත් ස්ථානයකි. සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩපහණේ නෙළුම්මලින් අර්ථවත් වන්නේ,
    i. තෘෂ්ණාව ii. කෙලෙස් iii. නිර්වාණය iv. සංසාර බිය

25. ලංකාවේ තුන් ඉරියව්වෙන්ම යුත් බුදු පිළිම නෙළා ඇති ස්ථානයක් වන්නේ,
    i. තන්තිරිමලය ii. ගල්විහාරය
    iii. මාළිගාවිල iv. අවුකන.

26. හේතුඵල සබඳතාවය මත විශ්ව පරිණාමය සිදුවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනාව වන්නේ,
    i. අග්ගඤ්ඤ සූත්‍රය ii. වාසෙට්ඨ සූත්‍රය
    iii. කාලාම සූත්‍රය iv. කූටදන්ත සූත්‍රය

27. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී ප්‍රතිමාවේ වම් පාදය, දකුණු පාදය මත සිටින සේ වැඩ සිටින අයුරින් නිර්මාණය කරන ආසන ක්‍රමය වන්නේ,
    i. වජ්‍රාසනය ii. වීරාසනය
    iii. පද්මාසනය iv. භද්‍රාසනය

28. මනා රාජ්‍ය පාලනයට ඉවහල් වන සප්ත අපරිහානිය ධර්ම බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
    i. ලිච්ඡවී රජදරුවන්ට ii. වජ්ජි රජදරුවන්ට
    iii. මල්ල රජදරුවන්ට iv. කාලාමයන්ට

29. බුදු දහමට අනුව සත්වයා සසර ඉපිද, ජීවත්ව, මරණයට පත් වී නැවත නැවතත් භවගාමී වීම පුනර්භවය ලෙස හැඳින්වේ. මෙසේ සත්වයා මැරෙන උපදින අයුරු දක්නා ඥානය හඳුන්වන නම වනුයේ,
    i. පුබ්බේ නිවාසානුස්සති ඥානය ii. චුතූපපාත ඥානය
    iii. ආසවක්ඛය ඥානය iv. සර්වඥතා ඥානය

30. දහමට අනුව සසර සැරිසරන සත්වයා කර්මානුරූපව උපත ලබන ලෝක තුන නිවැරදිව සඳහන් පිළිතුර වනුයේ,
    i. කාම ලෝකය, දිව්‍ය ලෝකය, බ්‍රහ්ම ලෝකය
    ii. කාම ලෝකය, රූප ලෝකය, අරූප ලෝකය
    iii. ප්‍රේත ලෝකය, නරකය, මිනිස් ලොව
    iv. දිව්‍ය ලෝකය, මිනිස් ලෝකය, සතර අපාය

31. සංඝ රත්නයට වැඳීම සඳහා අප භාවිතා කරන පාඨයෙහි ඇති සඟ ගුණ වලින් "ආහුණෙය්‍යො" යන්නෙහි ධර්මානුකූල අර්ථය වන්නේ,
   i. පරලොව සුවපතා දෙන දානය පිළිගැන්වීමට සුදුසුය යන්නය.
   ii. ආරාධනා කොට වැඩමවා සිව්පසය පුද කිරීමට සුදුසුය යන්නය.
   iii. සඟසතු කොට දන් පිළිගැන්වීමට සුදුසුය යන්නය.
   iv. වැඩ සිටින තැනට ගොස් පූජාකිරීමට සුදුසුය යන්නය.

32. "සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ - චිත්තං පඤ්ඤංච භාවයං" මෙම පාලි ගාථා පාඨයේ අර්ථය වඩාත් සමීප වන්නේ බුදු දහමේ එන,
   i. ත්‍රිවිද්‍යාවටය.   ii. ත්‍රි ශික්ෂාවටය.
   iii. ත්‍රිලක්ෂණයටය.   iv. තිපරිවට්ටයටය.

33. ගුවන් විදුලි ධර්ම දේශනයකදී බුදුන්වහන්සේගේ ගුණමහිමය විස්තර කරමින් චිංචිමානවිකාවගේ හා සුන්දරී පරිබ්‍රාජිකාවගේ කථා පුවත් ඉදිරිපත් කෙරින. මෙම කතා පුවත් වලින් ප්‍රකාශ වන්නේ උන්වහන්සේගේ,
   i. මහා ප්‍රඥාව යි.   ii. තාදි ගුණය යි.
   iii. පුරිසදම්මසාරථි ගුණය යි.   iv. අසමසම සීල ගුණය යි.

34. ධනය පුද්ගලයාට ඔහුගේ එදිනෙදා කාර්යය අනුව වැදගත් වුවත් බෞද්ධ අපගේ අවසන් ආගමික පරමාර්ථය අනුව වඩා වැදගත් වන්නේ සප්ත ආර්ය ධනයයි. එම සප්ත ආර්ය ධනය සඳහන් පිළිතුර වන්නේ,
   i. සද්ධා, වීර්ය, විතක්ත, විචාර, බුද්ධි, ඒතග්ගතා, උපේක්ඛා
   ii. සද්ධා, සීල, වීර්ය, විතක්ක, විචාර, ප්‍රීති, සුඛ
   iii. සද්ධා, වීර්ය, හිරි, ඔත්තප්ප, සති, සමාධි, පඤ්ඤා
   iv. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා

35. ධර්මලතා නිරතුරුව මෛත්‍රී භාවනාවේ නිරත උපාසිකාවකි. ප්‍රීතියෙන් කල් ගෙවන ඇය ප්‍රගුණ කරන මෙත් සිත නිසා ඇයට ලැබෙන ආනිසංස අතරින් පරලොව දිවියට අදාළ වන්නේ,
   i. නපුරු සිහින නොදැකීම   ii. මුහුණ ප්‍රසන්න වීම
   iii. දෙවියන්ට ප්‍රිය වීම   iv. සිහිමුළාව කළුරිය නොකිරීම

36. "ගැහැවිය , තොපගේ ගෙය නුවටුනට පැන් පොකුණක් මෙන් සිටියේ ය. එහෙයින් එළෙඹියා වූ ඔවුනට පිණ්ඩපාතය දිය යුතු කොට සිතව." බුදුරජාණන් වහන්සේ මේ ප්‍රකාශය කළේ,
   i. නිගණ්ඨනාථපුත්තටය.   ii. සිගාල ගෘහපතියාටය.
   iii. උපාලි ගෘහපතියාටය.   iv. නකුල පිතාටය.

37. බුදුරජාණන් වහන්සේගේ දහම් පණිවිඩය සමස්ථ මධ්‍ය දේශය පුරා පැතිර යාමට හේතු වූ සසුනේ මුල්ම ආරාම පූජාව නම්,
   i. ජේතවනාරාම පූජාව   ii. පූර්වාරාම පූජාව
   iii. වේළුවනාරාම පූජාව   iv. නිග්‍රෝධාරාම පූජාව

38. රුවන්වැලි සෑය නිර්මාණය කිරීම සම්බන්ධව විස්තර සඳහන් වන අපේ වංශ කථාව,
   i. දළදා සිරිත   ii. ථූපවංශය
   iii. දීපවංශය   iv. බෝධිවංශය

39. දහමට අනුව සෞන්දර්යය තුළින් ලබන ආස්වාදය කාමයෙන් තොරව අත්විඳිය හැක්කකි. ඒ සඳහා දහම තුළින් අපට දැක්විය හැකි උදාහරණයකට අදාළ නොවන්නේ,
   i. පඤ්චසිඛ දෙව්පුත්ගේ වීණා වාදනය
   ii. සෝණ කුටිකණ්න හිමිගේ ගායන හැකියාව.
   iii. වනවච්ඡ රහතන් වහන්සේගේ පරිසර වැනුම
   iv. වක්කලී හිමි බුදු සිරුර දෙස බලා ලැබූ ආස්වාදය

40. අනුරාධපුර යුගයේ පළමු උපතිස්ස රජ දවස ඇති වූ තුන්බිය දුරුකරලීමේ අරමුණින් පැවැත්වූ උත්සවයක් ගැන වංශකතාවල සඳහන් වේ. එම පූජා උත්සවය නම්,
   i. ගිරිභණ්ඩ පූජා උත්සවය   ii. අරියවංශ දේශනා උත්සවය
   iii. ගංගා රෝහණ පූජා උත්සවය   iv. ධාතු පූජෝත්සවය

සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

**11 - ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය - II**

නම/විභාග අංකය :- ........................................................................ **කාලය පැය 2 යි.**

* **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
* **පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

1. පළමුවන ප්‍රශ්නය - මෙම ප්‍රශ්න 10 ට කෙටි පිළිතුරු සපයන්න.

i. සීල සම්පන්න පුද්ගලයකු භාවනාව කරා යොමු වීමේදී සියලු ක්‍රියා සිහියෙන් හා දැනීමෙන් කිරීම අවශ්‍යය. එය දහමට අනුව හඳුන්වන නම කුමක්ද?

ii. ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් ආරම්භ කිරීමේ අරමුණින් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා විසින් ආරම්භ කරනු ලැබූ ආයතනය කුමක්ද?

iii. පාරමිතා ගුණධර්ම පුහුණු කරන්නෙක් පළමුව සිතේ ඇතිවන ක්ලේශ තුනක් ඉවත් කරගෙන ගුණාංග දෙකක් සිතේ ඇතිකර ගත යුතුය. එම ගුණාංග දෙක නම් කරන්න.

iv. අභිභූ නම් රහතන් වහන්සේ සහශ්‍රී ලෝක ධාතුවට ඇසෙන සේ ගාථා කී බව එක්තරා සූත්‍ර දේශනාවක සඳහන් වේ. එම සූත්‍රය නම් කරන්න.

v. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥාවට අයත් අංග දෙක නම් කරන්න.

vi. "චිත්තං සමේතීති සමතෝ" මෙම ගාථා පාඨයෙන් කියැවෙන අදහස කිනම් දහම් කරුණකට අදාළ ද?

vii. ජීව අජීව පරිසරය කෙරෙහි දයාන්විතව කටයුතු කිරීමට මිනිසා පොළඹවන ප්‍රබල සාධකයක්ද වන වරදින් වැළකීමේ ක්‍රමයක් දහමේ සඳහන් වේ. එය නම් කරන්න.

viii. "යළි යළිත් ඉපදී බුදු දහම ලෝකය පුරා ප්‍රචාරය කිරීමට ලැබේවා!" මෙය කාගේ ප්‍රාර්ථනාවක් ද?

ix. පිප්ඵලී නම් මානවකයා පැවිදිව රහත් බව ලබා බුදු සසුනේ අග තනතුරක් ද ලැබීය. එම රහතන් වහන්සේ නම් කරන්න.

x. "අත්තනාව කතං පාපං - අත්තනා සං කිලිස්සති" මෙම ගාථා පාඨයේ සිංහල අදහස ලියන්න.

(මුළු ලකුණු - 2x10=20)

2. "ආශ්‍රය කිරීමට සුදුස්සෙකු සොයන යමෙක් ඒ සඳහා තමාට සමාන හෝ ඊට වඩා උසස් අයෙකු නොලබන්නේ නම් තනිව වාසය කිරීම උතුම් ය."

i. මෙම අදහස දෙන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු - 2)

ii. මෙම ගාථාවට අනුව 'බාලයා' යන්න හඳුන්වන්න (ලකුණු - 3)

iii. ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා යහපත් මිතුරෙකුගේ ඇසුර හේතුවන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු - 5)

3. සීලය යනු කය, වචන දෙකේ සංවර බවයි. එසේම සීලය ආර්ය මාර්ගයේ පදනමද වේ. සීලය සම්පූර්ණ වීමට විරති හා සමාදාන යන දෙඅංශයම අවශ්‍යය. ගිහි බෞද්ධයා නිතර පිළිපදින සීලයක් ද, විශේෂ අවස්ථාවල පිළිපදින සීලයක් ද ඇත. පැවිදි පක්ෂයට වෙනම සීලයකි. එසේම සමාජ සදාචාරයට හේතුවන තුන් ආකාරයකින් සංවර විය යුතු සීලයක් ද ඇත.

i. ගිහි බෞද්ධයෙකුට සුවිශේෂ අවස්ථාවක සමාදම් විය හැකි සීලයන් දෙකක් නම් කරන්න. (ලකුණු - 2)

ii. තුන් ආකාරයකින් සංවර විය යුතු සීලය නම් කර එය හඳුන්වන්න. (ලකුණු - 3)

iii. සීලය සම්බන්ධව ඉහත දක්වා ඇති කරුණු පදනම් කරගෙන සීලය පුද්ගල හා සමාජ සදාචාරයට හේතුවන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු - 5)

4. i. බුදුරජාණන් වහන්සේ පරිසරයට හානි සිදුවීම වළකාලමින් භික්ෂු භික්ෂුණීන්ට පැනවූ විනය නීතියක් සඳහන් කරන්න. (ලකුණු - 2)
   ii. පරිසරයට අදාළව අපට පින් රැස් කර ගත හැකි ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු - 3)
   iii. පරිසරය ආරක්ෂා කර ගැනීමේ ඇති වැදගත්කම පෙන්වා දී ඒ සඳහා බොදු දරුවෙකු ලෙස ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැදිලි කරන්න. (ලකුණු - 5)

5. වදුරුස්ස විද්‍යාලයේ බෞද්ධ සංගමයේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව මෙවර යොදාගෙන තිබුණේ පැරණි අනුරාධපුර රාජධානිය නැරඹීම සඳහා ය. මෙම චාරිකාවේදී බුද්ධ ධර්මය උගන්වන ගුරු මහත්මිය හා සිසුන් අතර ඇතිවූ සාකච්ඡාවේදී සඳහන් වූ කරුණු වල කෙටි සටහනක් පහත දැක්වේ.
   * මෙම රාජධානියේ රාජ්‍ය කළ රජ දරුවන් අතරින් දුටුගැමුණු හා වළගම්බා යන රජවරු දෙදෙනාගෙන් සසුනට මහඟු සේවයක් ඉටුවිය.
   * එම සේවාවන් අතර ස්තූප, ප්‍රතිමා, සඳකඩපහණ වැනි කලා කෘතීන් නිර්මාණය කිරීමද විය.
   * එම ශ්‍රේෂ්ඨ රජදරුවන් අපේ ඇගයීමට ලක්විය යුතු අතර, එම උරුමයන් ආරක්ෂා කිරීම බොදු දරුවන් වන අපගේ යුතුකමයි.
   i. ඉහත සඳහන් රජවරු දෙදෙනා ඉදිකළ ස්තූප දෙකක් නම් කරන්න. (ලකුණු - 2)
   ii. ධාතු නිදන් කර ස්තූප සාදා උපහාර දැක්වීමට සුදුසු පුද්ගල කොට්ඨාස හතරක් ගැන බුදුහිමි දේශනා කර ඇත. ඉන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු - 3)
   iii. මහින්දාගමනයෙන් අප රටට උරුම වූ ඉහත සඳහන් කලා කෘතීන්ගෙන් ස්තූප හෝ ප්‍රතිමා නිර්මාණ ඇගයීමට ලක් කරමින් ඒවා අප විසින් ආරක්ෂා කළ යුත්තේ මන්දයි පැහැදිලි කරන්න. (ලකුණු - 5)

6. දිළිඳු බව දුකක් බව පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ ධාර්මිකව ධනය ඉපයීම අනුමත කළහ. ඒ යහපත් ආර්ථිකයකින් තොරව සදාචාරය ගොඩනැගීම දුෂ්කර නිසාය. ඒ අනුව උන්වහන්සේ ධනය ඉපයීමට උචිත රැකියා ආදිය තම දේශනා තුළ සඳහන් කර ඇත. එසේම ධනය ඉපයීම, ධන විනාශය, ධන පාරිභෝජනය සම්බන්ධයෙන් ද කරුණු දක්වා ඇත. එහිදි පත්තකම්ම සිඟාලෝවාද වැනි සූත්‍ර අපට වැදගත් වේ.
   i. ඉහත කී සූත්‍ර දේශනා තුළින් යමෙක් ධනය ඉපයීමේදී සැළකිල්ලට ගත යුතු කරුණු පහක් පෙන්වා දෙයි. ඉන් දෙකක් ලියන්න. (ලකුණු - 2)
   ii. ධනය විනාශ වන (භෝග අපාය මුඛ) ක්‍රම තුනක් ලියන්න. (ලකුණු - 3)
   iii. ඉහත ඔබ සඳහන් කළ කරුණුද උපයෝගි කරගෙන බුදු දහමට අනුව ධනය ඉපැයීම හා ධන පරිභෝජනය කෙසේ සිදුකල යුතුදැයි පෙන්වා දෙන්න. (ලකුණු - 5)

7. සුබෝධි දහම් පාසලේ වාර්ෂික කථික තරගයේදී සිසුවෙකු තම කතාවේ මාතෘකාව වශයෙන් තෝරා ගත්තේ "ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ය යන්නයි." ඒ සඳහා තේමා තුනක් යටතේ ඔහු කරුණු රැස් කළේය. එම තේමා තුන නම්,
   * උන්වහන්සේ හා සමකාලීන බමුණු හා පරිබ්‍රාජක වැනි අන්‍ය ආගමිකයින්ද බුදුරජාණන් වහන්සේ ඇගයීමට ලක් කිරීම.
   * පසු කාලීන වියතුන්ගේ ඇගයීමට ද උන්වහන්සේ ලක් වීම.
   * උන්වහන්සේගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ.
   i. බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කළ උන්වහන්සේ හා සමකාලීන බමුණු පූජකයෙක් හා පරිබ්‍රාජකයෙක් නම් කරන්න. (ලකුණු - 2)
   ii. උන්වහන්සේගේ චරිතයෙන් අපේ ජීවිතයට ආදර්ශයට ගත හැකි ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු - 3)
   iii. බුද්ධ චරිතයෙන් අපට ආදර්ශයට ගත හැකි ගුණාංග තුළින් ඔබගේ ජීවිත සාර්ථක කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු - 5)